**IPRC/16/261**

# බී. එස්. බ්ලූම්ගේ අධ්‍යාපන අරමුණු වර්ගීකරණය සහ ස්ටැනිස්ලාවුස්කිගේ රූපණ විධික්‍රමයෙහි දක්නට ලැබෙන සාම්‍යතා පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

අසංක කෝදාගොඩ[1*]

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ඕනෑ ම විෂයක් ඔස්සේ අත්පත් කර ගත යුතු සුවිශේෂ ඉගෙනුම් අරමුණු (Taxonomy of Educational Objectives) පිළිබඳ ගෙනහැර දක්වමින් බී. එස්. බ්ලූම් (1956), අධ්‍යාපනය නිසා කිසියම් පුද්ගලයකු ලබන වර්ධනය; ප්‍රජානන, ආවේදන සහ මනෝචාලක යන ක්ෂේත්‍ර ඔස්සේ දැනුම, ආකල්ප සහ කුසලතා වශයෙන් සමබර පෞරුෂයකට මඟ පෑදෙන බව නූතන අධ්‍යාපන අරමුණු යටතේ විග්‍රහ කොට ඇත. පුද්ගලයකු ලබන අධ්‍යාපනය සමතලිත වීමට නම් ප්‍රජානන, ආවේදන සහ මනෝචාලක යන අවස්ථා තුන ම පරිපූර්ණ විය යුතු අතර පුද්ගල පෞරුෂය සමතුලිත වන්නේ එසේ සිදු වුවහොත් පමණක් බව ද අවධාරණය කරයි. නළුවාගේ රංගන කාර්යයෙහි පරිසමාප්තිය කරා ළඟා කිරීමේ මඟක් වශයෙන් ස්ටැනිස්ලාවුස්කි ස්වකීය පර්යේෂණයේ දී සොයාගත් රූපණ විධික්‍රමයේ (Method Acting) බලපෑම රංග කලාව ඔස්සේ ලෝකය පුරා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන්නට විය. රූපණ විධික්‍රමයේ මූලිකාංග ඔස්සේ සාර්ථක නළුවකු බිහිවන ආකාරය පිළිබඳ ලවුස්කි තමාගේ පර්යේෂණ ඇස මෙහෙයවීය. ඒ අනුව බ්ලූම් හඳුන්වාදුන් ඉගෙනුම් අරමුණු සහ ස්ටැනිස්ලාවුස්කිගේ රූපණ විධික්‍රමයේ මූලිකාංගවල පවතින සාම්‍යතා විශ්ලේෂණාත්මකව හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. මෙය මූලාශ්‍රය අධ්‍යයනයක් වන අතර ඒ සඳහා ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රය භාවිත කරනු ලැබ ඇත. සමස්තයක් ලෙසට මෙම අධ්‍යයනයෙන් පසක් වූ එක් වැදගත් කරුණක් නම් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අධ්‍යාපන කාරකයක් ලෙස රූපණය නමැති නාට්‍ය භාවිතාව වින්දනාත්මක අධ්‍යාපනයකට මඟ සලසන බවයි.

***ප්‍රමුඛ පද:*** *ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ,ප්‍රජානන ක්ෂේත්‍රය ,ආවේදන ක්ෂේත්‍රය ,මනෝචාලක ක්ෂේත්‍රය ,රූපණ විධික්‍රමය*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව *asankakodagoda@gmail.com